

2023

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

விழிப்புலனற்ற நபர்களின் நம்பிக்கை நிதியம்

Rehabilitation of the Visually Handicapped Trust Fund

සමාජ සේවා දෙපාර්තමේන්තුව

දෙවන මහල

සෙත්සිරිපාය - II අදියර

බත්තරමුල්ල



2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

වැය ශීර්ෂය - 216-2-3-3-1508

සමාජ සේවා දෙපාර්තමේන්තුව
දෙවන මහල
සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල

දුරකතනය - 0112187050
ෆැක්ස් - 0112186276
ඊ මේල් - TrustFund20SSD@gmail.com

2023 වර්ෂයේ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය

01. පූජ්‍ය ගලබොඩ ඥානීස්සර ස්වාමීන් වහන්සේ	- යාවජීව සාමාජික
02. යමුනා පෙරේරා මහත්මිය	- සභාපති - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - ලේකම් - කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
03. අනෝජා හේරත් මහත්මිය	- සමාජ සේවා අධ්‍යක්ෂ
දර්ශනී කරුණාරත්න මහත්මිය	- සමාජ සේවා අධ්‍යක්ෂ
04. එන්.වයි.කොහොවල මෙනවිය	- ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
05. ආර්.එම් පි.එච්. ගුණරත්න මහතා	- ලේකම්- ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය
06.කමල්සිරි නානායක්කාර මහතා	- සභාපති- ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සම්මේලනය
07. කෞෂල්‍ය රාජපක්ෂ මහතා	- සිංහ සමාජ නියෝජිත - දිස්ත්‍රික් 306 B2 සිංහ සමාජය

නිරීක්ෂක

සුගත් වසන්ත ද සිල්වා - සභාපති - ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත උපාධිධාරී මණ්ඩලය

නිලධාරී මණ්ඩලය

01. ඊ.ඒ.වයි.එදිරිසිංහ මහතා	- ලේකම් - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
02. ජේ.එල්.අතුකෝරාළ මෙනවිය	- භාණ්ඩාගාරික - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
03. ජී. දිනූෂා සන්දීපනී මෙනවිය	- කළමනාකාර සහකාර නිලධාරී
04. කේ.ඩබ්.ආර්.ඉරේෂා මහත්මිය	- කළමනාකාර සහකාර නිලධාරී

පටුන

පරිච්ඡේදය 01 - අරමුදලේ පැතිකඩ

1.1. හැදින්වීම
1.2. නෛතික පසුබිම
1.3. පරමාර්ථ
1.4. ආයතනයේ දැක්ම , මෙහෙවර
1.5. අරමුදලේ ප්‍රධාන කාර්යයන්
1.6. සංවිධාන සටහන

පරිච්ඡේදය 02 - අරමුදලේ වාර්ෂික කාර්යසාධනය

2.1. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය
2.2. භෞතික කාර්යසාධන දත්ත
2.3. පනතේ පරමාර්ථ හා අනුගත වීම
2.4. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
2.5. විශේෂ ජයග්‍රහණ

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අවසන්වරට පැවති (2012) ජන හා නිවාස සංගණනයට අනුව පෙනීමේ අපහසුතා ඇති ජනගහනය ලක්ෂ නවය ඉක්මවා ඇති බව වාර්තා වී ඇත. එම සංගණනයට අනුව ශ්‍රී ලංකා ජනගහනයෙන් 8.7% ක් ආබාධිත තැනැත්තන් බව හෙලිදරව් වී ඇති අතර එම ප්‍රමාණය ලක්ෂ 16 ඉක්මවා තිබේ. ඒ අනුව බලන විට මෙරට ආබාධිත ජනගහනයෙන් බහුතරයක් දෘශ්‍යාබාධිත හෙවත් පෙනීමේ අපහසුතා පවතින ප්‍රජාව බව ප්‍රකට වේ.

පෙනීමේ අපහසුතාවය හැරුනවිට දෘශ්‍යාබාධිත පුද්ගලයින් ශාරීරිකව මෙන්ම බුද්ධියෙන් සාමාන්‍ය පුද්ගලයින් හා සමාන වේ. වර්තමානයේ ඔවුන්ගේ ආදායම් ඉපයීමේ ක්‍රියාවලිය කෙසේ වුව ද අතීතයේ ඔවුන් රට තුළ වෙසෙන සාමාන්‍ය ප්‍රජාව මෙන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය සඳහා විවිධ කර්මාන්තවල යෙදෙමින්, විවිධ රැකියාවල නිරත වෙමින් කාර්යක්ෂමව කටයුතු කළ පිරිසකි. විශේෂයෙන්ම දේශීය අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ නිරත වෙමින් ඔවුන් ජාතික නිෂ්පාදනයට සුවිශේෂී දායකත්වයක් සපයන ලදි.

1977 වර්ෂයේ හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග දෘශ්‍යාබාධිත ප්‍රජාවට තමන් සතුව පැවති ස්වාධීන ආර්ථික උත්පාදන ක්‍රියාවලියට විවිධ බාධා ඇතිවිය. විශේෂයෙන්ම තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් බිඳවැටෙන්නට විය. තරඟකාරීත්වය හමුවේ මෙම තත්ත්වයට මුහුණ දීමට තම ආබාධය ඔවුනට විශේෂ අපහසුතාවයක් විය.

මේ අනුව තමන් මුහුණ දුන් අපහසුතාවයන්ගෙන් යම් තරමක හෝ සහනයක් ලබා ගැනීමේ අරමුණෙන් ඔවුන් පෙළ ගැසුන අතර තමන් මුහුන දුන් මෙම අපහසුතා පිළිබඳව එවකට පැවති රජයේ අවධානය සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස දෘශ්‍යාබාධිත ප්‍රජාව සඳහා සහන සැලසීමේ සහ ඔවුන්ගේ සුභසාධනය සැලසීමේ අරමුණෙන් 1992 අංක 9 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල නමින් පාර්ලිමේන්තු පනතක් සම්මත කරගෙන එහි අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල පිහිටුවන ලදි.

ආරම්භයේ පටන්ම මෙහි කාර්යාලය සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන සම්පත් භාවිත කරමින් ක්‍රියාත්මක වේ. වර්තමානය වන විට මෙම අරමුදල සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ 216 යටතේ රු.මිලියන 9 ක් වෙන් වන අතර පවත්නා ප්‍රතිපාදන හමුවේ රට තුළ ජීවත්වන දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සේවයක් සැලසීම සඳහා අරමුදලේ සාමාජිකයින් සහ සාමාජික සංවිධාන එක්ව කටයුතු කරනු ලබයි. මෙම කාර්ය සාධන වාර්තාව මගින් අරමුදල වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති පිළිබඳව 2023 වර්ෂයට අදාළව සමස්ත කාර්යසාධනය ඉදිරිපත් කෙරේ.

1.2. නෛතික පසුබිම

1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලක් පිහිටුවීම සඳහා ද, එහි පරමාර්ථ හා බලතල නිශ්චය කොට දැක්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. වර්තමානයේ මෙම අරමුදල කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ඇති සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කොට ඇත.

1.3. පරමාර්ථ

පනතේ 5 ඡේදය අනුව දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

(අ) දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම

(ආ) දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හීදී ඔවුන්ට ස්වයංරැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශකත්වය සැපයීම

(ඇ) දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නේවාසික පහසුකම් සැපයීම

(ඈ) දෘශ්‍යාබාධිත තැනැත්තන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

(ඉ) දෘශ්‍යාබාධිත තැනැත්තන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම

(ඊ) සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වලක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම

1.4. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ දැක්ම සහ මෙහෙවර

දැක්ම
දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා අභිමානයෙන් යුත් ස්වාධීන ජීවිතයක්

මෙහෙවර
දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා සමානත්වය හා සමාන සහභාගීත්වය ලබාදීම සඳහා අවශ්‍ය සහය ලබාදීම මෙන්ම දෘශ්‍යාබාධිත තත්වයට පත්වන පුද්ගලයින් එයින් මුදවා ගැනීමට කටයුතු යෙදීම, පුනරුත්ථාපනය, ඔවුන් විෂයෙහි සුභසාධනය සැලසීම

1.5. අරමුදලේ ප්‍රධාන කාර්යයන්

1. ක්‍රීඩා ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා හෝ දෘශ්‍යාබාධිත පුද්ගල සංවිධාන සඳහා හෝ දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන විශේෂ පාසැල් සඳහා ක්‍රීඩා ආධාර ලබා දීම

2. අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්,දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සහ දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම

* බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මාසික සඟරාව (කාලය) සඳහා ආධාර ලබා දීම

* දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම

3. පුනරුත්ථාපන ආධාර ලබා දීම

* පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත් පුද්ගලයින් පුනරුත්ථාපනය කොට සමාජගත කිරීමේ වැඩසටහන

* සාමාන්‍ය අකුරින් මුද්‍රිත පොත් කථන ග්‍රන්ථ බවට පත් කිරීමේ කථන පුස්තක සැකසීමේ වැඩසටහන


* දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිබලය සහ පානීය ජලය සපයා ගැනීම සඳහා ආධාර ලබා දීම

4. දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වීම වැලැක්වීමේ අරමුණින් වයස අවුරුදු 60 ට අඩු පුද්ගලයින් සඳහා අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම

5. ජාත්‍යන්තර සුදු සැරයටි සුරක්ෂා දින සැමරුම් ජාතික වැඩසටහන පැවැත්වීම

6. විශේෂ ඉල්ලීම්වලට අනුව වෘත්තීය පුහුණු ආයතනවල සහ දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය ලබන පාසැල්වල උපදේශකවරුන් සඳහා (තාවකාලික) දීමනා ලබා දීම

1.6. සංවිධාන සටහන


සභාපති
ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
යාවජීව සාමාජික
පූජ්‍ය ගලබොඩ ඥානීස්සර ස්වාමීන් වහන්සේ
සමාජික 1
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජික 1
අග්‍රාමාත්‍ය ලේකම් හෝ නියෝජිත
සමාජික 1
සිංහ සමාජ නියෝජිත
සමාජික 2
ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය
ලේකම්
සභාපති
සමාජික 1
ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩල නියෝජිත
සමාජික 1
ශ්‍රී ලංකා ජාතික දෘශ්‍යාබාධිත සම්මේලන නියෝජිත
කාර්ය මණ්ඩලය
ලේකම්
භාණ්ඩාගාරික
කළමනාකරණ සහකාර නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී

පරිච්ඡේදය 02
අරමුදලේ වාර්ෂික කාර්යසාධනය

2.1. දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය

2023/12/31 දිනට වැය ශීර්ෂය 216- 02-03-3-1508

අනු අංකය	විස්තරය	ඇස්තමේන්තුව රු.	වියදම රු.
01	වෘත්තීය පුහුණු හා උපදේශක දීමනා	80,000.00	80,000.00
02	පුනරුත්ථාපන ආධාර	1,467,000.00	737,142.31
03	අධ්‍යාපන හා සංස්කෘතික ආධාර	4,803,000.00	4,661,357.00
04	ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය	1,070,110.00	1,070,110.00
05	අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර	94,000.00	92,954.00
06	විගණන ගාස්තු	159,100.00	158,700.00
07	පරිපාලන වියදම්	994,400.00	989,446.30
08	මූල්‍ය වියදම්	700.00	700.00
09	විවිධ වියදම්	140,800.00	139,257.00
එකතුව		**8,809,110.00**	**7,929,666.61**

2.2. භෞතික කාර්යසාධන දත්ත

විස්තරය	2023 වර්ෂය අවසානයේ භෞතික කාර්ය සාධනය
1. පවත්වන ලද කළමනාකරණ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව	08
2. අධ්‍යාපන හා සංස්කෘතික ආධාර	
i. 1 වසර සිට අ.පොෂ. (සා.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර	95
ii. අ.පොෂ.(උ.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර	17
iii. විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර	49
iv. දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර	169
v. බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මාසික සඟරාව (කාලය සඟරාව) කලාප	12
vi. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම	12
3. වෘත්තීය පුහුණු උපදේශක දීමනා ගෙවීම - උපදේශක වරුන්	01
4. පුනරුත්ථාපන ආධාර ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය මගින් පවත්වනු ලබන පසුකාලීනව දෘශ්‍යාබාධිත බවට පත්වූවන් සඳහා පවත්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහන	
i. උපදේශකවරුන්	05

ii. පුහුණුලාභීන්	19
iii. සාමාන්‍ය අකුරින් ලියැවුන පොත් කථන මාධ්‍ය පොත් බවට පත් කිරීමේ කථන පුස්තක ව්‍යාපෘතිය	මුද්‍රිත පිටු 24000
5. ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය	01
6. විවිධ ආධාර	02
i. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිය ලබා දීම්	01
ii. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා පානීය ජලය ලබා දීම්	
7. අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර ලබා දීම	03

2.3. පනතේ පරමාර්ථ හා අනුගත වීම

අනු අංකය	පරමාර්ථය	ක්‍රියාකාරකම
01	දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම	i. 1 වසර සිට අ.පොෂ.ස. (සා.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර ii. අ.පොෂ.ස.(උ.පෙළ) දක්වා දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ශිෂ්‍යාධාර iii. විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර iv. දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර v. දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම vi. බ්‍රේල් මාධ්‍යයෙන් නිකුත් කරනු ලබන මාසික vii. සහරාව (කාලය සහරාව) සඳහා ආධාර ලබා දීම
02	දෘශ්‍යාබාධිතයන්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම	i. අක්ෂි කාව හා අක්ෂි ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම ii. පුනරුත්ථාපන ආධාර ලබාදීම (පසුකාලීනව දෘශ්‍යාබාධිත භාවයට පත්වූවන් පුනරුත්ථාපනය කොට සමාජ ගත කිරීම) iii. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ නිවාස සඳහා විදුලිය හා පානීය ජලය ලබා දීම
03	සමාන අයිතිවාසිකම් සහ සමාන අවස්ථා ලබා ගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වලක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියා කිරීම	i. කථන පුස්තක සැකසීම සඳහා ආධාර ලබා දීම ii. ජාත්‍යන්තර සුදු සැරයටි සැමරුම් ජාතික උත්සවය පැවැත්වීම

2.4. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

	ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
4.5	2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයින්ට,ස්වදේශිකයින්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම	පාසැල් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම	ශිෂ්‍යාධාර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√
		දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ පාසැල් අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත නොවන දරුවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් ලබා දීම	ශිෂ්‍යාධාර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√
		විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් සඳහා තාක්ෂණික උපකරණ ලබා දීම (ජංගම දුරකථන)	තාක්ෂණික උපකරණ ලබාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව		√	
10.2	2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම	පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත් වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කර සමාජගත කිරීමේ වැඩසටහන් සඳහා අධාර ලබා දීම	පුනරුත්ථාපන වැඩසටහන සඳහා සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව			√

		දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ කියවීමේ අයිතිය තහවුරු කිරීම සඳහා බ්‍රේල් මාධ්‍යයෙන් මාසිකව නිකුත් කරනු ලබන කාලය සහරාව සඳහා ආධාර ලබා දීම	නිකුත් කරනු ලබන සහරා වාරික ප්‍රමාණය			√
		දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ සංචාරක මෙවලම වන සුදු සැරයටිය පදනම් කර ගනිමින් ජාත්‍යන්තර සුදු සැරයටි සුරක්ෂා දින සැමරුම් ජාතික උත්සවය	උත්සවය සඳහා සහභාගී වූ දෘශ්‍යාබාධිත පුද්ගල සංඛ්‍යාව			√

2.5 විශේෂ ජයග්‍රහණ

- 2023 වර්ෂය තුළ දෘශ්‍යාබාධිත දරුවන් 343ක් වෙනුවෙන් ශිෂ්‍යත්ව හා තාක්ෂණික උපකරණ ලබාදීමට හැකි වීම.

2.6 අභියෝග

- රටතුළ වෙසෙන සමස්ත දෘශ්‍යාබාධිත ප්‍රජාව සඳහා සේවා සැපයීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම.
- ප්‍රවාහන හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පසුකාලීනව දෘශ්‍යාබාධිත තත්ත්වයට පත් වූ කණ්ඩායම් සඳහා සිදුකරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන සඳහා සේවාලාභීන් සහභාගී කර ගැනීමේ දුෂ්කරතාවය.

2.7 ඉලක්ක

- දිවයින පුරා වෙසෙන සමස්ත දෘශ්‍යාබාධිත ප්‍රජාව ඉලක්ක කරමින් සේවා සැපයීම පුළුල් කිරීම.
- විශේෂ පාසල් වල සිටින දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම.

සභාපති
දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

නම - යමුනා පෙරේරා

තනතුර -

දිනය -

පරිච්ඡේදය 03

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

		2023 රු.	2022 රු.
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රධාන		8,460,000.00	9,000,000.00
වෙනත් ලැබීම්		410,000.00	183,656.26
ස්ථාවර තැන්පත් පොළිය		464,459.56	
		9,334,459.56	**9,183,656.26**
මෙහෙයුම් වියදම්			
ක්‍රීඩා ආධාර		-	30,000.00
වෘත්තීය පුහුණු වියදම්		40,000.00	220,000.00
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර		4,439,357.00	4,979,586.00
පුනරුත්ථාපන ආධාර		1,238,642.31	980,232.00
පරිපාලන වියදම්		991,516.30	799,729.12
අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර		92,954.00	17,500.00
විගණන ගාස්තු		158,700.00	138,000.00
මූල්‍ය වියදම්		-	4,758.65
විවිධ වියදම්		139,257.00	23,869.00
සුදු සැරයටි දින වියදම්		1,254,319.38	1,031,410.00
අමුද්‍රව්‍ය අපහරණ වියදම්		48,250.00	-
		8,402,995.99	**8,225,084.77**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / හිඟය		931,463.57	958,571.49

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ අතිරික්තය/හිඟය		**931,463.57**	**958,571.49**
ජංගම වගකීම්වල වැඩිවීම			
වෘත්තීය පුහුණු වියදම්			
සුදු සැරයටි දින වියදම්		10,000.00	
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර වියදම්			186,900.00
පුනරුත්ථාපන ආධාර			
පරිපාලන වියදම්		2,070.00	
මූල්‍ය වියදම්			
ජංගම වගකීම්වල අඩුවීම			
පුනරුත්ථාපන වියදම්		501,500.00	(20,225.00)
අධ්‍යාපන හා සංස්කෘතික ආධාර වියදම්		(222,000.00)	
සුදු සැරයටි වියදම්			
විගණන ගාස්තු			
හඳුනානොගත් ලැබීම්			
වෘත්තීය පුහුණු		(40,000.00)	(15,000.00)
ජංගම වත්කම්වල වැඩිවීම			
ස්ථාවර තැන්පත්		**(464,459.56)**	**(2,166,290.63)**
ජංගම වත්කම්වල අඩුවීම			
නිමි තොගය		48,250.00	
ලාභයට පසුගිය වසරෙන් ගලපන ලද මුදල			
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**766,824.01**	**(1,056,044.14)**
වර්ෂ මුල මුදල් හා මුදල්වලට සමාන දෑ		**1,975,975.61**	**3,032,019.75**
වර්ෂ අවසාන මුදල් හා මුදල්වලට සමාන දෑ		**2,742,799.62**	**1,975,975.61**

2023 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2023 රු	2022 රු
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු ශේෂය		2,742,799.62	1,975,975.61
ස්ථාවර තැන්පත්		2,630,750.19	2,166,290.63
අවසන් තොගය - අමු ද්‍රව්‍ය		-	48,250.00
නිමි තොගය		-	-
මුළු වත්කම්		**5,373,549.81**	**4,190,516.24**
වගකීම්			
-			
උපචිත වියදම්	01	1,297,245.00	1,045,675.00
මුළු වගකීම්		**1,297,245.00**	**1,045,675.00**
මුළු ශුද්ධ වත්කම්		**4,076,304.81**	**3,144,841.24**
හිමිකම			
සමුච්චිත අරමුදල		**3,144,841.24**	**2,186,269.75**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		931,463.57	958,571.49
මුළු ශුද්ධ හිමිකම		**4,076,304.81**	**3,144,841.24**

භාණ්ඩාගාරික
දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/D/VHTF/FS/2023

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 31 දින

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල

සභාපති
දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව් පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 01. ලේකම්, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/D/VHTF/FS/2023 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2024 මැයි 31 දින

සභාපති,
දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදල

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ හාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

2

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පනත මඟින් දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල පිහිටුවා අවුරුදු 31 ක් ගත වුවත් සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිතයින් සංඛ්‍යාව හඳුනාගැනීමට නොරතුරු පද්ධතියක් සකස්කර නොතිබුණි.

3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877 (2) (ඇ) ප්‍රකාරව අරමුදල සඳහා වන මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති